(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(3).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2024 මාර්තු 07 බ්‍රහස්පතින්දා

2024 මාර්තු 19 අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ඉලෙක්ට්‍රානික ගනුදෙනු පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාව සහ 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රානික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.03.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 07 දිනැති අංක 2370/15 දරන අති විශේෂ ගැසට් පළ කරනු ලැබ, 2024.03.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වගන්තිය යටතේ හිමිකම් ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 01 දිනැති අංක 2308/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.03.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝග,— 2022 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවේ උපදෙස් සහ නිර්දේශ මත එම පනතේ 5 සහ 6 වගන්ති සමඟ කියවිය යුතු 7 වගන්තිය යටතේ ඛනිජතෙල් නිෂ්පාදන බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූලි 10 දිනැති අංක 2340/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.03.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 අප්‍රේල් 09 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

589/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022.12.31 දිනට ශ්‍රී ලංකාවේ මුළු රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව එක් එක් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2019.01.01 සිට 2019.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2020 සිට 2022 දක්වා බඳවාගන්නා ලද සහ විශ්‍රාම ගන්වන ලද රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2023.01.01 දිනට මුළු රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට රාජ්‍ය සේවයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය කාලයේ ඇති වූ පුරප්පාඩු නොපිරවීම හේතුවෙන් රාජ්‍ය සේවයේ බිඳවැටීමක් සිදු වූ බව පිළිගන්නේද;

(iv) එම බිඳවැටීම වළක්වා ගනිමින් රාජ්‍ය සේවය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

613/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.01.01 දින වනවිට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති මත්පැන් බලපත්‍ර වර්ග කවරේද;

(iii) එම එක් එක් මත්පැන් වර්ගය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2023.01.01 දින සිට 2024.01.01 දින දක්වා ලබා දී ඇති මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) එම සංඛ්‍යාව, මේ වනවිට ලබා දී ඇති මුළු මත්පැන් බලපත්‍ර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) එම ප්‍රතිශතය, එක් එක් මත්පැන් බලපත්‍ර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත්පැන් සුලභ වීම, මත්පැන් පරිභෝජනය ඉහළ යෑමට ප්‍රධාන හේතුවක් බවත්;

(ii) එමඟින් මත්පැන් ආශ්‍රිත රෝග ඉහළ යාමෙන් සෞඛ්‍ය සඳහා වෙන් කළ යුතු මුදල ඉහළ යන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

637/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට වසා දමා ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල ඇති ඉඩම් සහ ගොඩනැගිලි වෙනත් ඵලදායී කටයුතු සඳහා භාවිතා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂයේදී අධ්‍යාපනය සඳහා විදේශ ගත වී ඇති මුළු ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් වෙනුවෙන් එක් වර්ෂයකට වැය කිරීමට සිදු වන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට ගුරු සේවයට අන්තර්ග්‍රහණය කර ඇති සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පවතින විදුහල්පතිවරුන්ගේ හිඟය මගහැරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1091/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා දුම්රියවල ගැටීම හේතුවෙන් ජීවිතක්ෂයට පත් වී ඇති වන අලින් සංඛ්‍යාව කොපමණද;

(ii) දුම්රියවල වන අලින් ගැටීම වළක්වා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් තිබේද;

(iii) මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) වන අලින් දුම්රියවල ගැටීම වළක්වා ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1127/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලි ගාස්තු ඉහළ යාම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ සිටින විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍යයන් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/2024

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, උඩවලව ජලාශය පසුගිය කාලයේ පැවති නියඟය හේතුවෙන් සිඳී ගිය බවත්;

(ii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව හා වන සතුන් ජලය නොමැති වීමෙන් දැඩි පීඩාවකට පත් වූ බවත්;

(iii) රොන්මඩ හේතුවෙන් එම ජලාශය විශාල ලෙස ගොඩ වී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) උඩවලව ජලාශයේ පවතින රොන්මඩ ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1153/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පාලනය කරනු ලබන පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා එම ස්ථානවල විධිමත් සනීපාරක්ෂක පහසුකම් සලසා දී තිබේද;

(iii) පුරාවිද්‍යා ස්ථානවලට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

(iv) පුරාවිද්‍යා ස්ථානවල අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හා නව ඉදිකිරීම් වැළැක්වීමට නිසි ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පුරාවිද්‍යා ස්ථාන දැක්වෙන නිල වෙබ් අඩවිය යාවත්කාලීන කර තිබේද;

(ii) එසේ නම්, කොපමණ කාලයකට වරක් යාවත්කාලීන කිරීම් සිදු කරනු ලබන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1250/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පසුගිය වසර කිහිපය තුළ ඉහළ ගිය ජීවන වියදමට සාපේක්ෂව වතු කම්කරුවන්ගේ දෛනික වැටුප වැඩි කිරීමේ ප්‍රගතිය කවරේද;

(ii) එවැනි ප්‍රගතියක් තිබේ නම්, එම වැටුප් වැඩිවීමේ ප්‍රමාණය කවරේද;

(iii) එකී වැටුප් වැඩිවීම ගෙවන ලද දිනය කවරේද; සහ

(iv) එවැනි ප්‍රගතියක් නොමැති නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා මුහුණ දෙන බාධාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

1253/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද ;

(ii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම කාර්යාංශය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම ක්‍රියාවලියේ ස්වාධීනත්වයට බලපෑම් එල්ල වන බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) මේ වනවිට දූෂිත ආයතනයක් බවට පත් වී ඇති ඉහත ආයතනය, එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1284/2024

ගරු අසංක නවරත්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) පුරප්පාඩු පිරවීම ප්‍රමාද වන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 අප්‍රේල් 10 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1287/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ශ්‍රම වාසනා අරමුදල" ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම අරමුදල මඟින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අරමුදලට මුදල් ලැබෙන මාර්ග කවරේද;

(v) එම අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1700/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හදිසි මිලදී ගැනීමේ යෝජනා ක්‍රමය අනුව අංක 2022/MSD/V/R/P/0066 ටෙන්ඩර්ය යටතේ මිලදී ගැනීම සඳහා අනුමත වූ ඖෂධ වර්ග තිස් දෙක (32) කවරේද;

(ii) එම ඖෂධ අතරින් සපයන ලද ඖෂධ වර්ග කවරේද;

(iii) එම ඖෂධ ලියාපදිංචි කර තිබේද;

(iv) ඉහත ටෙන්ඩරය ප්‍රදානය කිරීමේදී සම්මත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ඖෂධ භාවිතා කිරීමෙන් අහිතකර ප්‍රතිවිපාක වාර්තා වී තිබේද;

(ii) එම ඖෂධ සඳහා වැඩ ඇණවුම් ඉල්ලීම ලබා දුන්නේ කවුරුන්ද;

(iii) සෙල්සියස් අංශක 2 - 8 අතර උෂ්ණත්වයක් යටතේ ලබා දිය යුතු සමහර ඖෂධ ඉහත ඇණවුම තුළ අන්තර්ගත වී තිබියදී, වෛද්‍ය සැපයුම් අංශය විසින් එම ඇණවුම සඳහා අනුමතිය ලබා දීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1702/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ, පොලිස් පරීක්ෂක, පොලිස් සැරයන් සහ පොලිස් කොස්තාපල් යන එක් එක් තනතුරේ සේවය කරනු ලබන නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරින්ට උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) ශ්‍රී ලංකා පොලීසියට ආධුනික පොලිස් කොස්තාපල්වරුන් බඳවාගැනීමේදී, මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1727/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා පුත්තලම දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව සහ වන අලින් සංඛ්‍යාව එක් එක් වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1737/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගබඩාවල ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) භාවිතයට නොගන්නා වී ගබඩා නැවත භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 27/2024

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු හේෂා විතානගේ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නයන වාසලතිලක මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ලෙස සම්මත කර ගන්නා බවට විපක්ෂයේ මන්ත්‍රීවරුන් දැඩි විරෝධතා ඉදිරිපත් කර සිටිය දී එම විරෝධතා නොසලකා හරිමින් එකී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට පටහැනි ලෙස ආණ්ඩු පක්ෂයට එම පනත් කෙටුම්පතේ යම් වගන්තීන් සම්මත කරවා ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

විශේෂයෙන්ම,

(අ) එම පනත් කෙටුම්පතේ 13 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව එම වගන්තිය විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවත්, සරල බහුතරයකින් සම්මත කරවා ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබිය දී එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ආ) එම පනත් කෙටුම්පතේ 17 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම වගන්තිය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉවත් කර දමන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් එම වගන්තිය ඒ ආකාරයෙන්ම සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඇ) එම පනත් කෙටුම්පතේ 20, 33(6), 34(1), 35(1) වගන්තීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම්, ශ්‍රේෂ්ඨාධිකරණය සිදු කළ සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම නිර්දේශ කරන ලද සංශෝධන නොකර සරල බහුතරයකින් එම වගන්තීන් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඈ) එම පනත් කෙටුම්පතේ 21 වැනි වගන්තිය ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවටත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත් සහ එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉදිරිපත් කරන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් ඒ ආකාරයෙන් කටයුතු නොකර එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඉ) එම පනත් කෙටුම්පතේ 22 වැනි වගන්තිය ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව සංශෝධන සිදු කළ යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඊ) එම පනත් කෙටුම්පතේ 31 වැනි වගන්තිය ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පරිදි සංශෝධන සිදු කළ යුතු බවටත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

මේ බව තහවුරු කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ද එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් සම්මත කර ගැනීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව කටයුතු කර නොමැති බවත්, එසේ කටයුතු නොකිරීම නිසා දැනට එම පනත පවතින ආකාරයට එය සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය ඡන්ද ප්‍රමාණය පාර්ලිමේන්තුවේදී ලැබී ඇත් ද යන්න පිළිබඳව බලවත් ප්‍රශ්නයක් පැන නැඟී ඇති බවත් කථානායකවරයාට එම කොමිෂන් සභාව විසින් යොමුකරන ලද 2024 පෙබරවාරි 08 දිනැති ලිපියේ දක්වා ඇති හෙයින් ද;

එසේම, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියැවීමේ දී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විසින් පැහැදිලිවම බෙදීමක් ඉල්ලා සිටිය දී එම ඉල්ලීම නොසලකා බෙදීමක් ලබා නොදී එම පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියවීම බෙදීමකින් තොරව සම්මත කර ගැනීමට ඉඩ හැරීමෙන් ද;

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ආකාරයට ඇතැම් වගන්තීන් ආණ්ඩු පක්ෂය විසින් සම්මත කර ගෙන ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් ගැඹුරින් සලකා බලන තෙක් එම පනත්

කෙටුම්පත නීතියක් බවට පත් කිරීම සඳහා සහතිකය සටහන් නොකරන ලෙසට 2024 පෙබරවාරි 01 වැනි දින පැවති පක්ෂ නායකවරුන්ගේ විශේෂ රැස්වීමේදී විපක්ෂයේ මන්ත්‍රීවරයන් පිරිසක් කථානායකවරයාගෙන් ඉල්ලා තිබියදීත් එම ඉල්ලීම සැලකිල්ලට නොගෙන එම පනත් කෙටුම්පත නීතිගත කිරීම සඳහා සහතිකය සටහන් කිරීමෙන්ද;

2024 පෙබරවාරි 26 දින පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමේ දී පොලිස්පති ධුරය සඳහා ජනාධිපතිවරයා විසින් නිර්දේශ කර තිබූ නම සලකා බැලූ අවස්ථාවේ දී එසේ නිර්දේශ කරන ලද පුද්ගලයා එම ධුරයට පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් සිව් දෙනෙකු පක්ෂව ද, දෙදෙනෙකු විපක්ෂව ද ඡන්දය දී තිබිය දී සහ සාමාජිකයින් දෙදෙනෙකු ඡන්දය දීමෙන් වැළකී සිටිය දී සහ ඒ අනුව එකී නිර්දේශිත නාමය පොලිස්පති ධුරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව අනුමත කර නොතිබිය දී ජනාධිපතිවරයාට ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන ලද 2024 පෙබරවාරි 26 දිනැති ලිපියේ 4 වන ඡේදයේ,

> "කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ) ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමක දී ඡන්දය දීමෙන් වැළකී සිටීමක් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැති බැවින් නීතිය ඉදිරියේ ඡන්දය දීමෙන් වැළකී සිටීම විපක්ෂ වීමක් ලෙස සලකනු ලබන්නේ නම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ)(5) ව්‍යවස්ථාව අනුව උක්ත ප්‍රශ්නය සම්බන්ධයෙන් සම සමව ඡන්දය ලැබුණා සේ සලකන්නේ නම් සභාපතිවරයා වශයෙන් මාගේ තීරක ඡන්දය ද පක්ෂව ලබා දෙන බව කාරුණිකව දන්වමි"

යනුවෙන් සඳහන් කරමින් එසේ ජනාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද පුද්ගලයා නීති විරෝධී ලෙසත්, ව්‍යවස්ථා විරෝධී ලෙසත් පොලිස්පති ධුරයට පත් කිරීම සඳහා ජනාධිපතිවරයාට ව්‍යවස්ථා විරෝධී ලෙසත් නීති විරෝධී ලෙසත් අනුබල දීමෙන් ද, සහාය දැක්වීමෙන් ද, අනුග්‍රහය දැක්වීමෙන් ද;

කථානායකවරයා විසින් පාර්ලිමේන්තු කටයුතුවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බරපතල ලෙස උල්ලංඝනය වන අයුරින් කටයුතු කර ඇති හෙයින් ද;

පාර්ලිමේන්තුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යන උත්තරීතර ආයතන පිළිබඳව මහජන විශ්වාසය කඩවන ලෙස කථානායකවරයා කටයුතු කර ඇති හෙයින් ද;

කථානායකවරයා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග බරපතල ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

කථානායකවරයා පක්ෂග්‍රාහීව කටයුතු කරන බව පැහැදිලිවම ප්‍රදර්ශනය කරමින් කථානායක ධුරයේ ස්වාධීනත්වය ද, ගෞරවය ද, බරපතල ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

අපක්ෂපාතීව පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීමට බැඳී සිටින කථානායකවරයා විසින්ම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද කඩකර ඇති හෙයින් ද; සහ

කථානායක ධුරයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පැහැර හැර ඇති හෙයින්;

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා කෙරෙහි තවදුරටත් විශ්වාසයක් නොමැති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

---